# පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය

සමුපකාර සේවා, අලෙවි සංවර්ධන සහ පාරිභෝගික ආරක්ෂණ

රාජ්‍ය අමාත්‍යාංශය

# තනතුරු පුරප්පාඩු

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියෙහි පහත දැක්වෙන තනතුරුවල පුරප්පාඩු පිරවීම සඳහා සුදුසුකම්ලත් පුද්ගලයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## 01.ප්‍රලේඛන නිලධාරී තනතුර (II වන ශ්‍රේණිය) MA 5-2 – (තනතුරු 03)

**රැකියා විස්තරය :**

ලේඛන/සාකච්ඡා සටහන්/වාර්තා සැකසීම අධීක්ෂණය කිරීම, අවශ්‍ය තොරතුරු රැස්කිරීම/හුවමාරු කිරීම සඳහා වෙනත් අංශ හා ආයතන සමඟ සම්බන්ධීකරණය, නිසි ලේඛන පද්ධතියක් පවත්වාගෙන යාම, පුවත්පත් ලිපි සහ ප්‍රකාශන සැකසීම සම්බන්ධීකරණය කිරීම, වාර්තා පළකිරීම සම්බන්ධයෙන් මුද්‍රිත සහ විද්‍යුත් මාධ්‍ය ආයතන නිලධාරීන් සමඟ සම්බන්ධීකරණය, අධ්‍යක්ෂ විසින් පවරනු ලබන වෙනත් ඕනෑම රාජකාරියක් ඉටු කිරීම.

**සුදුසුකම්:**

**බාහිර අයදුම්කරුවන් සඳහා :** විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන විශ්වවිද්‍යාලයකින් ජන සන්නිවේදනය, පුවත්පත් කලාව හෝ තොරතුරු තාක්ෂණය/තොරතුරු පද්ධති පිළිබඳ ප්‍රථම උපාධියක් ලබා තිබීම.

**අතිරේක සුදුසුකම්:**

අදාළ ක්ෂේත්‍රය පිළිබඳව පිළිගත් ආයතනයකින් පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ලබා තිබීම අමතර සුදුසුකමක් ලෙස සැලකේ.

**වැටුප් පරිමාණය :** කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 02/2016 අනුව MA 5-2 2016: රු. (36,850 – 10 x 755 – 15 x 930 – 5 x 1,135 – 64,025)

**වයස:** වයස අවුරුදු 22 ට නොඅඩු විය යුතු අතර 45 ට නොවැඩි විය යුතු ය. අභ්‍යන්තර අයදුම්කරුවන් සම්බන්ධයෙන් ඉහළ වයස් සීමාව අදාළ නොවේ.

## 02. පිරිවැයකරණ නිලධාරී තනතුර (II ශ්‍රේණිය) MA 5-2 - (තනතුරු 03)

**රැකියා විස්තරය :**

නිෂ්පාදනය පිරිවැයකරණය සඳහා සහාය දැක්වීම , විශේෂයෙන් දක්වන ලද භාණ්ඩ හා සේවා වල මිල නියාමනය සඳහා සහාය දැක්වීම, දත්ත රැස්කිරීම අධීක්ෂණය සහ දත්ත සංචිත පවත්වාගෙන යාම, පාරිභෝගික භාණ්ඩ වල ජාත්‍යන්තර වෙළඳපොළේ මිල විචල්‍යතා පිළිබඳව අධ්‍යයනය කර වාර්තා කිරීම , කාර්යක්ෂමතා අධ්‍යයනය සඳහා සහයෝගය දැක්වීම, අධ්‍යක්ෂ විසින් පවරනු ලබන වෙනත් ඕනෑම රාජකාරියක් ඉටු කිරීම.

**සුදුසුකම් :**

**බාහිර අයදුම්කරුවන් සඳහා :** විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන විශ්වවිද්‍යාලයකින් ගණකාධිකරණය, වාණිජ්‍යය හෝ කළමනාකරණය පිළිබඳ ප්‍රථම උපාධියක් ලබා තිබීම.

හෝ

CIMA, ICASL, ACCA, CMA හෝ වෙනත් වෘත්තීය ගිණුම්කරණ ආයතනයක අන්තර්මධ්‍ය මට්ටම සම්පූර්ණ කර තිබීම.

**අතිරේක සුදුසුකම් :**

අදාළ ක්ෂේත්‍රය පිළිබඳව පිළිගත් ආයතනයකින් පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ලබා තිබීම අමතර සුදුසුකමක් ලෙස සැලකේ.

**වැටුප් පරිමාණය :** කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 02/2016 අනුව MA 5-2 2016: රු. (36,850 – 10 x 755 – 15 x 930 – 5 x 1,135 – 64,025)

**වයස :** වයස අවුරුදු 22 ට නොඅඩු විය යුතු අතර 45 ට නොවැඩි විය යුතු ය. අභ්‍යන්තර අයදුම්කරුවන් සම්බන්ධයෙන් ඉහළ වයස් සීමාව අදාළ නොවේ.

## 03.ගිණුම්කරණ නිලධාරී තනතුර (II ශ්‍රේණිය) MA 5-2 - (තනතුරු 07)

**රැකියා විස්තරය :**

වත්කම් සංචලන ලේඛන පවත්වාගෙනයාම, ලැබීම් සහ ගෙවීම් සත්‍යාපනය කිරීම, වැටුප් **ලේඛන** සහ වෙනත් ව්‍යවස්ථාපිත ගෙවීම් පරීක්ෂා කිරීම, මුදල් පොත පරිපාලනය කිරීම, මාසික ගිණුම් සකස් කිරීමට සහාය දැක්වීම, මාසික මුදල් පුරෝකථනය සකස් කිරීමට සහාය දැක්වීම, චෙක්පත් සකස් කිරීම, අධ්‍යක්ෂ විසින් පවරනු ලබන වෙනත් ඕනෑම රාජකාරියක් ඉටු කිරීම.

**සුදුසුකම්:**

**බාහිර අයදුම්කරුවන් සඳහා:** විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන විශ්වවිද්‍යාලයකින් ගණකාධිකරණය, වාණිජ්‍යය හෝ කළමනාකරණය පිළිබඳ ප්‍රථම උපාධියක් ලබා තිබීම හෝ ගණකාධිකරණය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාව ලබා තිබීම.

හෝ

CIMA, ICASL, ACCA, CMA හෝ වෙනත් වෘත්තීය ගිණුම්කරණ ආයතනයක අන්තර්මධ්‍ය මට්ටම සම්පූර්ණ කර තිබීම.

**අතිරේක සුදුසුකම්:**

අදාළ ක්ෂේත්‍රය පිළිබඳව පිළිගත් ආයතනයකින් පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ලබා තිබීම අමතර සුදුසුකමක් ලෙස සැලකේ .

**වැටුප් පරිමාණය :** කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 02/2016 අනුව MA 5-2 2016: රු. (36,850 – 10 x 755 – 15 x 930 – 5 x 1,135 – 64,025)

**වයස:** වයස අවුරුදු 22 ට නොඅඩු විය යුතු අතර 45 ට නොවැඩි විය යුතු ය. අභ්‍යන්තර අයදුම්කරුවන් සම්බන්ධයෙන් ඉහළ වයස් සීමාව අදාළ නොවේ.

## 04.පරිපාලන නිලධාරී තනතුර (II ශ්‍රේණිය) MA 5-2 – (තනතුරු 02)

**රැකියා විස්තරය :**

භාණ්ඩ හා සේවා ප්‍රසම්පාදන කටයුතු වලදී සහාය දැක්වීම, සේවකයන් බඳවා ගැනීමේදී සහාය දැක්වීම, උපයෝගීතා බිල්පත්, වැටුප් තොරතුරු, විශ්‍රාම ප්‍රතිලාභ පිළිබඳ ලැයිස්තු, පැමිණීමේ සහ නිවාඩු වාර්තා සැකසීම, ප්‍රවාහන පාලනය සම්බන්ධ වාර්තා පවත්වා ගැනීම, ආයතන පරිශ්‍රයේ පවිත්‍රතාවය පවත්වාගෙන යාම සහ සෞඛ්‍ය සහ ආරක්ෂාව සම්බන්ධ ක්‍රියාමාර්ග ගැනීම, සේවක භාරකාර අරමුදල **(EPF)/** සේවක අර්ථ සාධක අරමුදල **(ETF)** සම්බන්ධීකරණය කිරීම**,** අදාළ ආයතන සමඟ සම්බන්ධ වී පාරිතෝෂික ගෙවීම් සහ වෙනත් විශ්‍රාම ප්‍රතිලාභ ගෙවීමට කටයුතු කිරීම, සේවකයන්ගේ වැටුප් සහ වෙනත් අත්තිකාරම් ගෙවීම**,** සේවා සපයන්නන් සමඟ සියලුම ගිවිසුම් ක්‍රියාත්මක කිරීමට සහයෝගය දැක්වීම, තැපැල සම්බන්ධ කටයුතු ඉටුකිරීම, මානව සම්පත් කළමනාකරණ පද්ධති පවත්වාගෙනයාම හා යාවත්කාලීන කිරීම, පුහුණු අවශ්‍යතා හඳුනා ගැනීමට සහ පුහුණු සැලසුම් ක්‍රියාත්මක කිරීමට සහාය දැක්වීම, සේවකයන් සහභාගී වූ පුහුණු වැඩසටහන්වල ප්‍රගතිය නිරීක්ෂණය කිරීම, සියලු අභ්‍යන්තර විභාග පැවැත්වීමට සහාය දැක්වීම, කලින් කලට සිදු කරනු ලබන සේවකයන්ගේ කාර්යසාධනය ඇගයීම් සිදු කිරීමට සහාය වීම සහ අධ්‍යක්ෂ විසින් පවරනු ලබන වෙනත් ඕනෑම රාජකාරියක් ඉටු කිරීම.

**සුදුසුකම්:**

***බාහිර අයදුම්කරුවන් සඳහා:*** විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන විශ්වවිද්‍යාලයකින් ව්‍යාපාර පරිපාලනය/ රාජ්‍ය පරිපාලනය/ ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ ප්‍රථම උපාධියක් ලබා තිබීම.

**අතිරේක සුදුසුකම්:**

අදාළ ක්ෂේත්‍රය පිළිබඳව පිළිගත් ආයතනයකින් පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ලබා තිබීම අමතර සුදුසුකමක් ලෙස සැලකේ

**වැටුප් පරිමාණය :** කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 02/2016 අනුව MA 5-2 2016: රු. (36,850 – 10 x 755 – 15 x 930 – 5 x 1,135 – 64,025)

**වයස:** වයස අවුරුදු 22 ට නොඅඩු විය යුතු අතර 45 ට නොවැඩි විය යුතු ය. අභ්‍යන්තර අයදුම්කරුවන් සම්බන්ධයෙන් ඉහළ වයස් සීමාව අදාළ නොවේ.

## 05.මාධ්‍ය නිලධාරී MA 5-2 – (කොන්ත්‍රාත් පදනම මත) – (තනතුරු 01)

**රැකියා විස්තරය:**

මහජනතාව දැනුවත් කිරීම සඳහා වාර්තා ලිවීම, වාර්තා පළකිරීම සඳහා මුද්‍රිත සහ විද්‍යුත් මාධ්‍ය ආයතන නිලධාරීන් සමඟ සම්බන්ධීකරණය, මාධ්‍ය සඳහා ප්‍රවෘත්ති සහ තොරතුරු වාර්තාකරණය, මහජනතාව දැනුවත්කිරීම සහ වෙනත් කාර්යයන් සඳහා දත්ත සහ තොරතුරු රැස්කිරීම, අභ්‍යන්තර හා බාහිර පාර්ශවයන් සමඟ සන්නිවේදනයෙහි නිරත වීම, පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය සම්බන්ධ දත්ත පද්ධතියක් සහ වාර්තා සටහනක් පවත්වාගෙන යාම, සිදුවීම් වාර්තාකරණය සඳහා ඡායාරූප ශිල්පී මෙහෙයවීම, සහකාර අධ්‍යක්ෂ ( ආයතනනික සන්නිවේදන) විසින් පවරනු ලබන වෙනත් රාජකාරියක් ඉටු කිරීම.

**සුදුසුකම් :**

**බාහිර අයදුම්කරුවන් සඳහා:** විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන විශ්වවිද්‍යාලයකින් ජනසන්නිවේදනය හෝ ජනමාධ්‍යකරණය පිළිබඳ ප්‍රථම උපාධියක් ලබා තිබීම සහ අදාළ ක්ෂේත්‍රය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ලබා තිබීම.

**වැටුප :** රු. 36,850 /-

වැටුප් පරිමාණයෙහි ආරම්භක පියවරට සමාන මාසික දීමනාවක් සහ 02/2016 කළමනාකරණ සේවා චක්‍රලේඛය අනුව ඉහත වැටුප් පරිමාණයට හිමි අනෙකුත් අදාළ දීමනා. කොන්ත්‍රාත් කාලසීමාව දීර්ඝ කළහොත් ඔහුගේ / ඇයගේ කාර්යසාධනය පිළිබඳව සලකා බලා MA 5-2 වැටුප් පරිමාණයෙහි එක් වැටුප් පියවර වැඩිවීමකට හිමිකම් ලබයි.

අංක 02/2016 කළමනාකරණ සේවා චක්‍රලේඛයෙහි ඇමුණුම් අංක II හි සඳහන් උපදෙස් අනුව වැටුප් ගෙවිය යුතු ය. කොන්ත්‍රාත්තුව වාර්ෂිකව අලුත් කිරීම සම්බන්ධයෙන් සලකා බැලිය හැකි ය.

**තනතුරේ ස්වභාවය: කොන්ත්‍රාත් පදනම මත**

මෙම තනතුරෙහි පත්වීම වර්ෂයක කොන්ත්‍රාත්තුවකට යටත් වන අතර මෙය ස්ථිර තනතුරක් ලැබීම සඳහා හිමිකමක් වශයෙන් සලකනු නොලැබේ.

මෙම පත්වීම යටතේ පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ ස්ථිර රැකියාවකට හිමි කිසිදු ආකාරයේ හිමිකමක් නොලැබේ.

**වයස:** වයස අවුරුදු 22 ට නොඅඩු විය යුතු අතර 45 ට නොවැඩි විය යුතු ය.

**පොදු කොන්දේසි:**

**වෙනත් දීමනා :** අදාළ රජයේ චක්‍රලේඛ අනුව වැටුපට අමතරව ජීවන වියදම් දීමනාව සහ වෙනත් අදාළ දීමනා ගෙවනු ලැබේ.

**පත්වීමේ ස්වභාවය:**

ස්ථිර තනතුරක් වන අතර අදාළ රාජ්‍ය චක්‍රලේඛයන්හි විධිවිධානයන්ට අනුව සේවක අර්ථසාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදල යටතේ ප්‍රතිලාභ ලැබීමට හිමිකම් ලබයි.

**බඳවාගැනීමේදී වැටුප:**

බාහිර වශයෙන් බඳවාගන්නා ලද පුද්ගලයින් වැටුප් පරිමාණය ආරම්භක පියවරෙහි තබනු ලැබේ. අභ්‍යන්තරව බඳවාගනු ලබන පුද්ගලයින්ගේ වැටුප ආයතන සංග්‍රහයෙහි VII වන පරිච්ඡේදයේ විධිවිධාන අනුව තීරණය කරනු ලැබේ.

**තනතුරෙහි ස්ථිර කිරීම:** බඳවාගනු ලබන අයදුම්කරුවන් වසර තුනක පරිවාස කාලයකට යටත් වේ. පරිවාස කාලය තුළදී ඔහුගේ ඇයගේ කාර්යසාධනය සහ හැසිරීම සතුටුදායක වන්නේ නම් ඔහු/ ඇය අදාළ තනතුරෙහි ස්ථිර කරනු ලැබේ. ස්ථිර තනතුරක සේවයේ යෙදී සිටින අභ්‍යන්තර අයදුම්කරුවන් එක් වසරක වැඩ බලන කාලසීමාවකට යටත් කරනු ලැබේ.

**බඳවාගැනීමේ පරිපාටිය :** බඳවාගැනීමේ බලධිකාරීන් විසින් පත්කරනු ලබන මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂයක් මඟින් තෝරා ගනු ලැබේ.

**සම්මුඛ පරීක්ෂණය**

සම්මුඛ පරීක්ෂණයේ ලකුණු සටහන පහත පරිදි වේ:

- අදාළ අතිරේක පළපුරුද්ද - ලකුණු 30
- අදාළ අමතර සුදුසුකම් - ලකුණු 30
- වෙනත් ජයග්‍රහණ - ලකුණු 15
- සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කිරීම - ලකුණු 25

මුළු ලකුණු ලකුණු 100

**වෙනත්**

ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතු ය.
දිවයිනෙහි ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට බැඳී සිටිය යුතු ය.
තනතුරෙහි රාජකාරි ඉටු කිරීම සඳහා සුදුසු ශාරීරික සහ මානසික සෞඛ්‍යයකින් හෙබි අයෙකු විය යුතු අතර විශිෂ්ඨ චරිතයකින් හෙබි අයෙකු විය යුතු ය.

සුදුසුකම් ලත් අයදුම්කරුවන් 2021.05.07 දිනට පෙර මෙම දැන්වීම පළකර දින 14 ක් ඇතුළත ලියාපදිංචි තැපෑලෙන් පහත දැක්වෙන ලිපිනයට අයදුම්පත් යොමු කළ යුතුය. සුදුසුකම් සනාථ කරන අදාළ සහතික වල පිටපත් අයදුම්පතට අමුණා එවිය යුතු ය. රාජ්‍ය අංශයේ සේවකයින් ස්වකීය අයදුම්පත්‍ර අදාළ අංශ ප්‍රධානීන් මඟින් යොමු කළ යුතුය. ඉහත අවශ්‍යතාවල ට අනුකූල නොවන , අසම්පූර්ණ අයදුම්පත්‍ර සහ අයදුම්පත්‍ර භාරගැනීමේ අවසන් දිනට පසුව ලැබෙන අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ. කවර ආකාරයකින් අනිසි බලපෑම් කිරීමට උත්සාහ දැරීම නුසුදුසුකමක් වනු ඇත. අයදුම් කරන තනතුර ලිපි කවරයෙහි වම් පස ඉහළ කෙළවරෙහි සඳහන් කළ යුතුය. අයදුම්පත් පහත ලිපිනයට එවිය යුතුය ;

**අධ්‍යක්ෂ ජනරාල්,**
**පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය,**
**දෙවන මහළ, සතොස මහ ලේකම් ගොඩනැගිල්ල,**
**අංක 27 , වොක්ෂෝල් වීදිය,**
**කොළඹ 02 .**